# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) - 11 - 2449823
වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: බීඩීජ්/965/1/508

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2008.11.11

**අයවැය චක්‍රලේඛ අංක: - 141**

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්/**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ව්‍යවස්ථාපිත මණ්ඩල සහ**
**රාජ්‍ය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත.**

**<u>2008 වසරේ ඉදිරි කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය වියදම් කළමනාකරණය</u>**

ලෝක ආර්ථිකයේ මෑතදී ඇති වූ අයහපත් ප්‍රවණතාවන් හේතුවෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට සිදු වූ බලපෑමද, පසුගිය දිනවල ඉන්ධන හා ආහාර ද්‍රව්‍යවල මිල සීඝ්‍ර ලෙස ඉහළයෑම හේතුවෙන් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ ඉන්ධන මත අය කරනු ලැබූ බදු විශාල වශයෙන් අඩු කිරීම නිසා රාජ්‍ය ආදායමට ඇති වූ බලපෑම ද, ජාතික ආරක්ෂාව හා පොහොර සහනාධාර වැනි රජයේ ඇතැම් වියදම් සඳහා අතිරේක පිරිවැය දැරීමට සිදුවීමද සැලකිල්ලට ගනිමින් මෙම වසරේ ඉදිරි කාලය තුළ රජයේ වියදම් දැරීම දැඩි අරපිරිමැස්මකින් කළ යුතු යැයි 2008.11.05 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත. මේ අනුව 2008 වර්ෂයේ ඉදිරි කාලය තුළ රාජ්‍ය වියදම් දැරීමේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

(අ) දැනට බැඳීම්වලට පැමිණ නැති සියළුම සැපයුම් හා සේවා වහාම ක්‍රියාත්මක වන පරිදි අවුරා තැබීමට කටයුතු කිරීම.

(ආ) දැනට බැඳීම් වලට පැමිණ නොමැති සියළුම ඉදිකිරීම් කටයුතුද යන්ත්‍රෝපකරණ හා වාහන වැනි ප්‍රාග්ධන භාණ්ඩ මිළදී ගැනීම්ද අත්හිටුවීම.

(ඇ) පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් අතිරේක බැඳීම් කිසිවක් ඇති කර නොගැනීම.

(ඈ) අනෙකුත් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදන වලින් වියදම් දැරීම මෙම වසරේ ඉදිරි කාලපරිච්ඡේදය අවසන් වන තෙක් කල් දැමීම.

02. මෙම කරුණු සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා උපරිම ලෙස සහාය දක්වනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වෙමි.

එස්. අබේසිංහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත: - විගණකාධිපති - ඉහත සඳහන් උපදෙස් අනුව කටයුතු කිරීම හේතුවෙන් ඇතැම් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත 2008 වසර සඳහා සලසනු ලැබූ ප්‍රතිපාදනවල ඉතිරිවීම් දක්නට ලැබිය හැකි බව කරුණාවෙන් සැලකීම මැනවි.